ශ්‍රී ලංකා වැසිවනාන්තර භාරය

# සිංහරාජ හා කන්නෙලිය වනාන්තරවල සදෘශ්‍ය වන වගා ව්‍යාපෘති

කේ. පී. එස්. වර්ණවීර
ශ්‍රී ලංකා වැසි වනාන්තර භාරය වැඩ සටහන් සම්බන්ධීකාරක

**ඉඩම් විකිණීමට තිබෙන බව දැනුම් දෙන දැන්වීම් පුවරුවල "සංවර්ධනය කරන ලද ඉඩම" යනුවෙන් දක්වා ඇත. මෙවැනි ඉඩමක් පරීක්ෂා කළහොත් යන්ත්‍ර සූත්‍ර යොදා ගහකොළ සම්පූර්ණයෙන් ඉවත්කොට පස්කපා සමතලාකර තාරපාරවල් යොදා ඇති බව ඔබට පෙනෙනු ඇත. ගහකොළ සම්පූර්ණයෙන් ඉවත් කිරීම සංවර්ධනය ද? මිනිසාගේ ජීවත්වීම සඳහා ගහ කොළ සම්පූර්ණයෙන් ම ඉවත් කළ යුතුද? අනෙක් සතුනට මෙන් වනාන්තරය තුළ ගහකොළ අතර මිනිසාට ජීවත්විය නොහැකිද?**



මානව වර්ගයා ඇතුළු ජීවිත අතර අන්තර් පැවැත්ම පවත්වා ගෙනයාම සඳහා වනාන්තර වැදගත් සාධකයක්. නමුත් මෙම වනාන්තර දිනෙන් දින මිහිතලයෙන් විනාශ කර දැමීමට එහි ජීවත්වන උසස් මනසක් ඇති මනාව වර්ගයා ක්‍රියාකිරීම කණගාටුවට කරුණකි. පෘථිවියේ නිවර්තන කලාපයේ වැසි වනාන්තර මිහිතලය සුරක්ෂිත කිරීමට උපකාරීවනවා පමණක් නොව පරිසර පද්ධති සමතුලිතව පවත්වාගෙන යාමටද සමත්වනු ලැබේ. නිවර්තන වැසි වනාන්තර සංරක්ෂණය කිරීම වර්තමානයේ මානව වර්ගයාගේ යුතුකමක් හා වගකීමක් වන්නේ එකී අන්තර් සබඳතාවය හේතුකොට ගෙනයි. කොංගෝ, ඇමේෂන්, හිමාලය වැනි වනාන්තර නිවර්තන කලාපයේ ප්‍රධාන වැසි වනාන්තර වේ. ශ්‍රී ලංකාව වැසි වනාන්තර අතරින් ගත්කළ තිරිත දිග වැසිවනාන්තර ජීවීන්ගේ පැවැත්මට මෙන්ම පරිසර සමතුලිත බව රැකගැනීමට ද මහෝපකාරී වේ.

තිරිතදිග වැසිවනාන්තර අතර ප්‍රධාන තැනක් ගනු ලබන්නේ සිංහරාජ වනාන්තරයයි. එයට අමතරව කන්නැලිය, කොට්ටව වැනි නිවර්තන වැසිවනාන්තර ප්‍රදේශ ද වැදගත් වේ. 1881 දි 84% ක්ම පැවැති වනගහණය මේ වන විට 20% ටත් පහල මට්ටමකට පැමිණ ඇත. තේ රබර් පොල් හා වී වගාවේ ව්‍යාපෘතිය වැඩි වන ජනගහනයට පදිංචිවීමට ඉඩ ප්‍රස්ථා අවශ්‍යවීම ආදි කරුණු නිසා ශ්‍රී ලංකාවේ තිරිතදිග වැසිවනාන්තර විනාශය අනෙක් ප්‍රදේශවලට වඩා ඉහළ මට්ටමක පැවැතීමට හේතු සාධක වේ.

තෙත්කලාපයේ ඉතිරිව ඇති වනාන්තර එකිනෙක වෙන්ව තැනින් තැන විසිරී පිහිටා ඇත. මෙලෙස සංඛ්‍යාත්මක වශයෙන් වනභූමි සියයකට මදක් වැඩි ප්‍රමාණයක් කුඩා කට්ටි ලෙස තේ වලාවන් හා ගම්මානවලට මැදිවී පිහිටා ඇත.



ශ්‍රී ලංකාව ආසියාවේ ඉතා කුඩා රටක් වුවද, ජෛව විවිධත්ව වටිනාකම අතින් ඉහල මට්ටමක පවත්නා බව පසුගිය වසරවල කරන ලද විද්‍යාත්මක පර්යේෂණ වලින් අනාවරණය වී තිබේ. 1990 දී "තොමත් මේයර්" මහතා තිරිතදිග වැසිවනාන්තර වල පවත්නා ජෛව විවිධත්වය පිළිබඳ ජාත්‍යන්තර අවධානය යොමුකර ලෝකයේ සුවිශේෂ වැසිවනාන්තර 18 අතරට ශ්‍රී ලංකාවේ තිරිත දිග වැසිවනාන්තර ද අතුළත් කර ඇත.

මෙම වැසි වනාන්තර වලට ප්‍රධාන වශයෙන් තර්ජන එල්ලවන්නේ ඒ වටා පිහිටා ඇති ගම්මානවල ජනතාවගෙනි. ඔවුන් ආහාර බෙහෙත් හා සත්ව ආහාර එක්රැස් කරගැනීමටද කෘෂිකර්මාන්තය තේ රබර් පොල් ඇතුළු ආර්ථික භෝග වගාවන් සඳහා පාරම්පරිකව මෙම වනාන්තර යොදගනු ලැබේ. සිංහරාජ වනාන්තරයේ හා ආරක්ෂක කලාපයේ ඇති ශාක විශේෂ 75% ක් පමණ ඉහත කී ප්‍රයෝජන සඳහා යොදගන්නා බවයි.

ශ්‍රී ලංකාවේ වැසිවනාන්තර ආරක්ෂා කිරීම සඳහා රජය 1994 වර්ෂයේ දී ජෛව විවිධත්ව සංරක්ෂණ සැලැස්මක් සකස් කොට වනාන්තර වල ජෛව විවිධත්වය ආරක්ෂා කිරීමට පියවර ගෙන ඇත.

ඊට අමතරව 1995 දී ඇරඹී මහා වනසැලැස්ම හා පස් අවුරුදු ක්‍රියාකාරි සැලැස්ම තුළත් ද වැසිවනාන්තර සුරැකීමට අවධානය යොමුකර තිබුණු අතර වන ආඥපනත සංශෝධනය කිරීමෙන් නව නීති හඳුන්වා දී සංරක්ෂිත වානාන්තර කෙරෙහි වැඩි අවධානයක් යොමුකොට ඇත.

මෙම කාර්‍යභාරයෙදී රජයට අමතරව තිරිතදිග වැසි වනාන්තර හා ජෛව විවිධත්වය ආරක්ෂා කිරීමට රාජ්‍ය නොවන සංවිධාන ඉදිරිපත් වීම ඉතා වැදගත් වේ. එවන් රාජ්‍ය නොවන සංවිධානයක් වන්නේ "**ශ්‍රී ලංකා වැසි වනාන්තර භාරයයි** "මහා භාරකාර ආයතනයේ අංක 10/09/2004 යටතේ ලියාපදිංචි වී ඇත. අපේ අනාගතය වෙනුවෙන් ශ්‍රී ලංකා වැසිවනාන්තර එහි ප්‍රධාන තේමාව වේ.

මෙම රාජ්‍ය නොවන සංවිධානය මගින් විනාශ වී ගිය වැසි වනාන්තර ආශ්‍රිතව සදෘශ්‍ය වනවගාව (Analog Forestry)ව්‍යාප්ත කිරීම මූලික අරමුණ අතර වේ. 1800 දී පමණ ඉංග්‍රීසින් විසින් වැසි වනාන්තර එළිපෙහෙළි කොට ආර්ථික භෝග හඳුන්වාදීම නිසා විනාශවී ගිය තිරිතදිග වැසිවනාන්තර වන සිංහරාජ හා කන්නැලිය වනාන්තර ඒකාබද්ධ කොට ජෛව විවිධත්වය ආරක්ෂාකිරීම වැසි වනාන්තර භාර ක්‍රියාකාරි සැලැස්මේ අඩංගු වී ඇත.

හෙක්ටයාර 11187 පුරා ව්‍යාප්තව පවත්නා සිංහරාජ වනාන්තරය දිගින් කි.මි.21 සහ පළලින් කි.මි.3 පමණ වන වපසරියක පිහිටි ජෛව විවිධත්වයේ අනුන පරිසරයකි. 1991 - 1996 දක්වා සිදුකරන ලද ජාතික සංරක්ෂණ සමීක්ෂණයේ දී කාෂ්ඨීය ශාක 337 ක් සොයාගෙන ඇති අතර ඉන් විශේෂ 1920 ඒක දේශීය වන අතර විශේෂ 116 ක් විශ්ව මට්ටමින් තරජනයට ලක්වි ඇති බව අනාවරණය වී ඇත.

කන්නැලිය වනාන්තරයේ කෘෂ්ඨීය ශාක 234 ඇති අතර ඉන් විශේෂ 155 ඒක දේශීය වන අතර විශේෂ 106 විශ්ව මට්ටමින් තර්ජනයට ලක්වෙමින් පවතී.

කන්නැලිය හා සිංහරාජ වනාන්තර අතීතයේ එක්ව පවතින්නටත් එම පරිසර පද්ධති දෙක වෙන්වීමට බලපා ඇත්තේ විදේශිකයින් විසින් ආර්ථික භෝග සඳහා එළිපෙහෙළි කිරීමයි. මෙසේ එළිපෙහෙළි කිරීමෙන් වනාන්තර දෙක අතර කිසිදු ජෛව විද්‍යාත්මක අන්තර් සබඳතාවයක් නොමැතිවීම මෙම වැසි වනාන්තර විනාශවීමේ තර්ජනයට හේතු වී තිබේ.

ශ්‍රී ලංකාවේ වැසි වනාන්තරභාරය පිහිටුවීමේ පරමාර්ථ වන්නේ කන්නැලිය හා සිංහරාජ වනාන්තරය අතර අතීතයේ මෙන් නොවුනත් වනාන්තර පටියක් නිර්මාණය කිරීමට ගාල්ල දිස්ත්‍රික්කයේ නෙළුව හා නවලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දෙකෙහි පිහිටා ඇති කන්නෙලිය හා සිංහරාජ වනාන්තර අතර මුඩු ඉඩම් අක්කර 2000 ක් පමණ පටියක් (කෝරිඩෝවක) භූමිභාගය සදෘෂය වනවගාව Analoy Forestry) වැඩසටහන ක්‍රියාත්මක කිරීමට නියමිතයි. එවිට එකී පරිසර පද්ධති දෙකෙහි ජීවින් හා සතුන් පමණක් නොව ශාක විශේෂ සංරක්ෂණය වීම හරහා එම වනාන්තර සංරක්ෂණයට උපකාරී වනු ඇත.

හබරකඩ, ගොඩපිටිගම, පොල්බිඳින කන්ද, ඇඹේලේගෙදර, බටුවන්ගල බටහිර යන ගම්මාන හරහා ඉහත වන වගා වැඩ සටහන ක්‍රියාත්මක සැලැස්ම වේ.

මෙහි දී විශේෂයෙන්ම එහි ජීවත්වන ගම්වාසීන්ගේ ජීවන රටාවට කිසියම් හානියක් සිදු නොවන අතර ඔවුන්ගේ ආර්ථික වගාවන් ද සුරක්ෂිත වන ආකාරයට සැලසුම් ක්‍රියාත්මක කරනු ලැබේ. එම වනගහනය තුළ ජීවත්වන ප්‍රජාව විසින්ම පරිසර

**ශ්‍රී ලංකාවේ වැසිවනාන්තර ආරක්ෂා කිරීම සඳහා රජය 1994 වර්ෂයේ දී ජෛව විවිධත්ව සංරක්ෂණ සැලැස්මක් සකස් කොට වනාන්තරවල ජෛව විවිධත්වය ආරක්ෂා කිරීමට පියවර ගෙන ඇත. ඊට අමතරව 1995 දී ඇරඹී මහා වනසැලැස්ම හා පස් අවුරුදු ක්‍රියාකාරි සැලැස්ම තුළින් ද වැසිවනාන්තර සුරැකීමට අවධානය යොමුකර තිබුණු අතර වන ආඥපනත සංශෝධනය කිරීමෙන් නව නීති හඳුන්වා දී සංරක්ෂිත වානාන්තර කෙරෙහි වැඩි අවධානයක් යොමුකොට ඇත.**

පද්ධතිය සුරක්ෂිත කිරීම හා අවශ්‍ය දැනුම, අධ්‍යාපනික වැඩ සටහන් ක්‍රියාත්මක කළ යුතුයි. ඒ සඳහා සදෘශ්‍ය වන වගා වැඩ සටහන ක්‍රියාත්මක කිරීම වැසි වනාන්තර භාරයේ විෂය පතයට ඇයත් කරුණකි. යම් ගොවියකුගේ ගෙවත්ත අයත්වන ප්‍රදේශය දේශගුණයට අනුරූප වූ එහි උත්කර්ෂ ප්‍රජාව සහ පාරිසරික ක්‍රියාකාරිත්වය අනුකරණය කරන ගස් ප්‍රමුඛත්වයක් ගන්නා කළමණාකරණය කරන ලද ගෙවතු පාරිසරික පද්ධතියකි. මේ පාරිසරික කළමණාකරණයේ දී ග්‍රාමීය ජනතාව ආර්ථික වශයෙනුත් සමාජීය වශයෙනුත් ශක්තිමත් කරනු ලබන අතර ජනතාවට අලෙවි කළ හැකි නිෂ්පාදන ලබාදෙන ශාඛ විශේෂ වගාකරනු ලැබේ. නැතහොත් ස්වභාවික වනාන්තරයෙ විවිධ ස්ථාරවල ඇති ශාක වර්ග මිනිසාට ප්‍රයෝජනයට ගත හැකි ශාකවලින් ප්‍රතිෂ්තාපනය කිරීමයි. සදෘශ්‍ය වන වගාවක් ස්වභාවික උත්කර්ෂ ප්‍රජාවට සර්වසම නොවුනද ස්වභාවික වනාන්තරයකින් ඉටු කෙරෙන බොහෝ කාර්‍යයන් ඉටු කිරීමට එය සමත් වේ. ඒ අනුව පාංශු ඛාදනය නවතී. පසේ තෙතමනය හා පෝෂණ පදර්ථ රැකගනී. මේ නිසා ජල උල්පත් ආරක්ෂාවේ. ස්වාභාවික ගංගා ඇළදෙළ ආරක්ෂා වේ. වනගහනය තුළ සතුනට අවශ්‍ය ආහාර තිබෙන හෙයින් ජෛව විවිධත්වය ද ආරක්ෂා වේ. එබැවින් සදෘශ්‍ය වන වගා ව්‍යාපෘතිය මිනිසාට අවශ්‍ය වන නිෂ්පාදන ලබාදෙන ජෛව විවිධත්වය දියුණු කරන, පරිසර සංරක්ෂණයට අනුබල දෙන තිරසාර සංවර්ධන යෝජනා ක්‍රමයකි. රාජ්‍ය නොවන සංවිධාන විසින් මේ සදෘශ්‍ය වනවගා සංකල්පය ඉදිරියට ගෙන එන විට විවිධ රාජ්‍ය ආයතන එය නව සංකල්පයක් යැයි සිතා බිය වී පහර දීමට තැත් කරති. පෘථිවි තලයේ නිවර්තන කලාපයේ පවතින වැසි වනාන්තර ආරක්ෂා කිරීමේ දී ඉහත වනවගා ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කොට ඇත. උදා: මැලේසියාවේ Sabah හි Infapro ව්‍යාපෘතිය සහ ද. අප්‍රිකාවේ ගයනාහි Iwokrama ව්‍යාපෘති හැඳින්විය හැක.

තිරසාර සංවර්ධනයෙදී සදෘශ්‍ය වනවගා සංකල්පය ඉතාමත් උචිත සංකල්පයකි. නමුත් එය බිය විය යුතු තරම් යක්ෂයකු නොවේ. තෙත් කලාපයේ අපේ පැරණි ගොවියන්ගේ ගෙවත්ත සදෘශ්‍ය සැබෑ වනවගා ආදර්ශයකි. එහි යටි ගොත්තේ ඉඟුරු, කහ, ගහල, විවිධ එළවලු වර්ග දක්නට ඇත. උපවියන් ස්ථරයේ වෙරළු, ලොවි, උගුරැස්ස, දෙඩම්, පේර, පලතුරු ශාක දක්නට ලැබේ. වියන් ස්ථරයේ කොස්, දෙල් වැනි එදිනෙද ආහාරයට ඵල ලබාදෙන ශාක ඇත. නෙරු ස්ථරයේ පොල්, පුවක් වැනි ආර්ථික භෝගත් මෙයට අමතරව අවරෝහක ශාක ලෙස වගා කරන ගම්මිරිස්, විවිධ අලවර්ග ආර්ථික ප්‍රතිලාබ ගෙන දේ.



**සදෘශ්‍ය වන වගා ව්‍යාපෘතිය මිනිසාට අවශ්‍ය වන නිෂ්පාදන ලබාදෙන ජෛව විවිධත්වය දියුණු කරන, පරිසර සංරක්ෂණයට අනුබල දෙන තිරසාර සංවර්ධන යෝජනා ක්‍රමයකි. රාජ්‍ය නොවන සංවිධාන විසින් මේ සදෘශ්‍ය වනවගා සංකල්පය ඉදිරියට ගෙන එන විට විවිධ රාජ්‍ය ආයතන එය නව සංකල්පයක් යැයි සිතා බිය වී පහර දීමට තැත් කරති.**

කඳුකර මුඩුබිම් සංරක්ෂණයේදීත් කඳුකර ජනාවාසවල පාංශු සංරක්ෂණයේදිත් ජෛව විවිධත්වයෙන් අනූන විසංගමනය වූ කුඩා වනාන්තර සංරක්ෂණය කිරීමේදීත් මෙම සදෘශ්‍ය වන වගා ව්‍යාපෘති ක්‍රමය භාවිතා කළ හැකිය. ආචාර්ය රනිල් සේනානායක මහතා විසින් බණ්ඩාරවෙල මීරහ වත්තේ ඇතිකරන ලද සදෘශ්‍ය වන වගාව මුඩුබිම් සංරක්ෂණය සඳහා කදිම නිදර්ශනයකි. වසර 15 කට පෙර අතහැර දමන ලද නිසරු තේවත්තක් සදෘශ්‍ය වනවගා ක්‍රමය භාවිතයෙන් මේ වන විට දියුණු ජෛව විවිධත්වයෙන් යුත් වනගහනයක් සාර්ථකව නිර්මාණය කොට ඇත. ගාල්ලේ වක්වැල්ල පාර, බෝගහගොඩැල්ල විහාර මාවතහි පිහිටි වැසි වනාන්තර සුරකීමේ අන්තර් ජාතික ආයතනය හා සහ සම්බන්ධව පිහිටුවා ඇති ශ්‍රී ලංකාවේ වැසි වනාන්තර භාරය, මගින් මේ වන විටත් සිංහරාජ හා කන්නෙලිය කොරිඩෝ ප්‍රදේශයේ සදෘශ්‍ය වන වගාව සඳහා ඉඩම් හඳුනාගෙන ඇත.

වැසි වනාන්තර භාරය සඳහා ඉදිරියේ දී මිලදී ගනු ලබන ඉඩම්වල අයිතිය මහාභාරකාරවරයා සතුවන අතර වනවගා ව්‍යාපෘතිය තුළින් ලැබෙන ප්‍රතිලාභ නැවතත් එහි වෙසෙන ප්‍රජාවගේ අවශ්‍යතා සඳහා යොදවනු ලැබේ. එමගින් දිගින් දිගටම ක්‍රියාත්මක වැඩ සටහනක් බවට "ශ්‍රී ලංකා වැසි වනාන්තර භාරය" පත්වනු ඇත. මේ වන විට රුහුණු විශ්ව විද්‍යාලය සමග වැසි වනාන්තර ආරක්ෂා කිරීමේ ජාත්‍යන්තර ආයතනය සමග අවබෝධතා ගිවිසුමක් අත්සන් කොට ඇති අතර එතුලින් විශ්ව විද්‍යාල සිසුන් ද සදෘශ්‍ය වනවගා ව්‍යාපෘතියේ අධ්‍යයන කටයුතුවල දයකත්වය හිමිකම් කියනු ලැබේ. පරිසර පද්ධති ආශ්‍රිතව කරනු ලබන නව සොයාගැනීම් විවිධ පර්යේෂණ මෙම වනගහනයෙන් අනාගත පරපුරට උකහා ගත හැකි වන අතර එතුලින් මුළු මහත් මානව වර්ගයාගේ පැවැත්මට හේතු සාධක වනු ඇතැයි ශ්‍රී ලංකා වැසි වනාන්තර භාරයේ ඉල්ලක්ක අතර ප්‍රධාන තැනක් ගනී. ❑

සාකච්ඡා කළේ -
**කුමාර උදයරත්න**
**යක්කලමුල්ල විශේෂ වාර්තාකරු**
ඡායාරූප -
**ශ්‍යාන් විරෝෂිත උදයරත්න**